රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:29/98

මගේ අංකය::IV/2/9/156/6/39(එච්)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1998.12.30 වැනි දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාවය ඇති
## රාජ්‍ය නිලධාරීන්ට දිරිදීමනා ගෙවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව පිළිබඳව වූ IV පරිච්ඡේදය කෙරේ ඔබගේ අවධානය යොමු කෙරේ.

02. හැඳින්වීම :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වගන්තිය අනුව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වන අතර, දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් වීමත්, ඉංග්‍රීසි භාෂාව සම්බන්ධීකරණ භාෂාව වීමත් සැලකිල්ලට ගන්නා කල දෙවැනි හා තෙවැනි භාෂාවක ලබන ප්‍රවීණතාවය තුළින් රාජ්‍ය සේවය වඩාත් ඵලදායි කිරීම සඳහා දිරිදීමනාවන් ලබාදීම අවශ්‍යය යන පදනම මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02.1 භාෂා ප්‍රවීණතාවය සඳහා දිරිගැන්වීමේ ක්‍රම හඳුන්වා දෙන ලද 1989.07.31 හා අංක 38/89, 1990.03.22 දිනැති අංක 38/89(I), 1991.04.24 දිනැති අංක 38/89(II), 1995.10.09 දිනැති අංක 38/89(III) හා 1998.04.28 දිනැති අංක 09/98 දරණ චක්‍රලේඛ අවලංගු කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරන අතර, 1998 මාර්තු මස 11 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

02.2 මෙම චක්‍රලේඛයේ දිරිගැන්වීමේ දීමනාව සඳහා පළමු භාෂාව යනු නිලධාරියෙකු තම වර්තමාන තනතුරට/සේවයට පත්වූ භාෂා මාධ්‍යයයි.

උදාහරණ:- නිලධාරියා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබුවද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජ්‍ය සේවයට ඇතුළත් වූයේ නම් ඔහුගේ පළමු භාෂාව ඉංග්‍රීසි භාෂාව වන අතර, සිංහල හා දෙමළ භාෂා පිළිවෙලින් ඔහුගේ දෙවන හා තෙවන භාෂා වශයෙන් සැලකිය හැකිය.

02.3 බඳවා ගැනීමේ පරිපාටිය හෝ සේවා ව්‍යවස්ථාව අනුව තනතුරට / සේවයට පත් කිරීම සඳහා අදාළ වන භාෂා මාධ්‍යය පැහැදිලි නොවන අවස්ථාවකදී මෙම දීමනාව ගෙවීම සඳහා නිලධාරියා ද්විතීයික අධ්‍යාපනය හෝ තෘතීයික / උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යය පළමු භාෂා මාධ්‍යය ලෙස සැලකිය යුතුය.

02.4 දෙවැනි භාෂාවකද, තෙවැනි භාෂාවකද දක්වන ප්‍රවීණතාව සඳහා ලබාගත හැකි මෙම දීමනාව, බඳවා ගැනීමේ දී අවශ්‍ය කරන මූලික සුදුසුකම් අනුව දෙයාකාර වේ.

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ඊට සමාන හෝ ඊට පහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළුවීම සඳහා වූ මූලික අධ්‍යාපන සුදුසුකම වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දිරිදීමනාව.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය හෝ ඊට සමාන හෝ ඊට වඩා ඉහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළුවීම සඳහා වූ මූලික අධ්‍යාපන සුදුසුකම වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දීමනාව.

03. දීමනාව ලබාගැනීමේ සුදුසුකම්:

3 : 1 අ.පො.ස. (සා.පෙළ) සහතිකය හෝ ඊට සමාන හෝ ඊට පහළ සහතිකයක් රජයේ සේවයට ඇතුළුවීම සඳහා මූලික සුදුසුකම් වන සේවයක නිලධාරීන්ට දෙනු ලබන දීමනාව ගෙවිය හැක්කේ මෙහි පහත 3 : 1 : 1 හා 3 : 1 : 3 යටතේ දැක්වෙන අවශ්‍යතා දෙකම සම්පූර්ණ කරන්නේ නම් පමණි.

3 : 1 : 1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ,

i. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය
ii. ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය
iii. අ.පො.ස. (සා.පෙළ) විභාගය
iv. අ.පො.ස. (සා.පෙළ) ලන්ඩන් විභාගය
v. ජාතික ඉංග්‍රීසි සහතිකය

යන විභාගවලින් එක් විභාගයකින් අදාල භාෂාව විෂයයක් ලෙස සමත්වීම.

හෝ

vi. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන පනතේ විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ලියාපදිංචි වූ ආයතනයක අදාල භාෂාව පිළිබඳ පාඨමාලාවක් හදාරා ලබන ලද වෘත්තීය සහතිකයක්

හෝ

vii. රජයේ හෝ රාජ්‍යානුබද්ධ ආයතනයක් විසින් පවත්වනු ලබන ඉහත විභාග හා සමාන මට්ටමේ වන බවට ආයතන අධ්‍යක්ෂ විසින් පිළිගනු ලබන විභාගයකින් අදාල භාෂාව විෂයක් ලෙස සමත්වී තිබීම,

මෙම චක්‍රලේඛයේ සඳහන් දිරි දීමනාව සඳහා අදාල වන ලිඛිත සුදුසුකම සම්පූර්ණ කිරීමක් ලෙස සැළකේ.

3 : 1 : 2 ඉහත 3 : 1 : 1 හි සඳහන් විභාගයකින් වෛකල්පිත විෂයක් ලෙස අදාල භාෂාව සමත්වීම මත පමණක් මෙම දිරිදීමනාව ගෙවිය නොහැකිය.

3 : 1 : 3 ආයතන අධ්‍යක්ෂ වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත්වීම දිරිදීමනාව ලැබීම සඳහා අවශ්‍ය වාචික සුදුසුකම සපුරාලීමක් වේ.

3 : 1 : 4 පහත සඳහන් අවස්ථාවන්හිදී ඉහත 3 : 1 : 3 හි සඳහන් වාචික පරීක්ෂණ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැකිවේ.

I. දිරිදීමනාව ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂා අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයකින් සමත්ව ඇත්නම්

හෝ

II. දිරිදීමනාව ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂාව විෂයක් ලෙස සමත්වූ විභාගයට එම භාෂා මාධ්‍යයෙන්ම පෙනී සිට සමත්ව ඇත්නම්

හෝ

III. දිරිදීමනා ඉල්ලා සිටිනු ලබන දෙවන හෝ තෙවන භාෂාව ඉහත 3 : 1 : 1 හි සඳහන් විභාගයකින් සමත්ව සිටියදී අදාල භාෂාව නිලධාරියාගේ මව් භාෂාව වන්නේ නම්

හෝ

IV. ඉහත 3 : 1 : 1 හි සඳහන් විභාගයකින් දිරිදීමනා ඉල්ලා සිටින භාෂාව විෂයයක් ලෙස සමත්වීමේදී එකී විභාගයේ කොටසක් ලෙස අදාල භාෂාව පිළිබඳ වාචික පරීක්ෂණයකින් සාමාර්ථය ලබා ඇත්නම්

හෝ

V. ඉහත 3 : 1 : 1 හි සඳහන් ලිඛිත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු දිරිදීමනා ඉල්ලා සිටින භාෂාවෙන් වාචිකව අදහස් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් ප්‍රවීණතාවයක් ඇති බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පෞද්ගලික නිර්දේශය මත අදාල අමාත්‍යාංශ ලේකම් විසින් වාචික පරීක්ෂණයෙන් නිදහස් කිරීම පිළිබඳ සෑහීමකට පත් වන්නේ නම්,

3 : 1 : 5 ඉහත ලිඛිත හා වාචික සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරියෙකු 3 : 1 : 1 යටතේ විභාගයකින් අදාල භාෂා විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇත්තේ නම්, එක් භාෂාවකට රු. 150/= බැගින් දෙවන හා තෙවන භාෂා සඳහා රු. 300/= ක උපරිම දීමනාවක් විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ලෙස අදාල නිලධාරියාට ගෙවිය හැකිවේ.

3 : 1 : 6 ඉහත ලිඛිත හා වාචික සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරියෙකු 3 : 1 : 1 යටතේ විභාගයකින් අදාල භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා ඇත්නම් ඉහත 3 : 1 : 5 හි දීමනාවට අමතරව වැටුප් වර්ධකයකට සමාන විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් හා එක් වරක් පමණක් ගෙවන රු.500/= ප්‍රසාද මුදලක් අදාල නිලධාරියාට ගෙවිය හැකිවේ.

3 : 1 : 7 ඉහත ලිඛිත හා වාචික සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරියෙකු 3 : 1 : 1 යටතේ විභාගයකින් අදාල භාෂාව සඳහා විශිෂ්ඨ සම්මාන සාමාර්ථය ලබා ඇත්නම් 3 : 1 : 5 හි සඳහන් දීමනාවට අමතරව වැටුප් වර්ධකයකට සමාන විශ්‍රාම වැටුප් රහිත මාසික දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු.1000/= ප්‍රසාද මුදලක් ද අදාල නිලධාරියාට ගෙවිය හැකිවේ.

3 : 1 : 8 මුල් අවස්ථාවේ සාමාන්‍ය සාමාර්ථය ලබා දිරිදීමනාව ලබන නිලධාරියෙකු පසුව සම්මාන හෝ විශිෂ්ඨ සම්මාන සාමාර්ථ සහිත සුදුසුකම සම්පූර්ණ කලහොත් ඊට අනුරූපව 3 : 1 : 6, 3 : 1 : 7 දක්වා ඇති ප්‍රතිලාභ අදාල සුදුසුකම ලැබූ දින සිට හිමිවේ. එහෙත් එක්වරක් පමණක් ගෙවන ප්‍රසාද දීමනාව ගෙවීමේදී ඊට පෙර ගෙවන ලද ප්‍රසාද දීමනාව හා ලැබිය යුතු ප්‍රසාද දීමනාව අතර, වෙනස පමණක් ගෙවිය යුතුවේ.

3 : 2 අ.පො.ස. (උ.පෙළ) සහතිකය හෝ ඊට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ සහතිකයක් රජයේ සේවයට ඇතුළුවීම සඳහා වූ මූලික අධ්‍යාපන සුදුසුකම මත සේවයක නිලධාරීන්ට දෙනු ලබන දීමනාව.

3 : 2 : 1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ,

i. උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගය.
ii. අ.පො.ස. (උ.පෙළ) විභාගය
iii. විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය
iv. අ.පො.ස. (උසස් පෙළ) ලන්ඩන් විභාගය
යන විභාගවලින් එක් විභාගයකින් අදාල භාෂාව විෂයක් ලෙස සමත්වීම

හෝ

v. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන පණතේ විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ලියාපදිංචි වූ ආයතනයක අදාල භාෂා විෂය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම.

හෝ

vi. පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන පණතේ විධිවිධාන යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ලියාපදිංචි වූ ආයතනයක පවත්වන ලද සාමාන්‍ය උපාධි පරීක්ෂණයකදී හෝ විශේෂ උපාධි පරීක්ෂණයකදී හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයකදී හෝ පශ්චාත් උපාධි පරීක්ෂණයකදී අදාල භාෂාව විෂයක් ලෙස සමත්ව තිබීම.

හෝ

vii. දිරිදීමනා ඉල්ලා සිටින භාෂා මාධ්‍යයෙන් උපාධියක් හෝ පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා සාර්ථකව සම්පූර්ණ කර ඇත්නම්

හෝ

viii. රජය හෝ රාජ්‍යානුබද්ධ ආයතනයක් මගින් පවත්වනු ලැබූ ඉහත විභාග හා සමාන මට්ටමේ වන බවට ආයතන අධ්‍යක්ෂ විසින් පිළිගනු ලබන විභාගයකින් අදාළ භාෂා විෂය පිළිබඳ ලබන ලද ප්‍රවීණතාව මත මෙම දිරිගැන්වීමේ දීමනා ගෙවිය හැකිවේ.

3 : 2 : 2 ඉහත 3 : 2 : 1 හි දක්වා ඇති අ.පො.ස. (උ.පෙළ) හා සමාන මට්ටමේ විභාගයකින් අදාල භාෂා විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිත ප්‍රවීණතාවය සම්පූර්ණ කරන නිලධාරියෙකුට එක් භාෂාවක් සඳහා රු.150/= බැගින් දෙවන හා තෙවන භාෂා සඳහා රු.300/= ක උපරිම දීමනාවක් ද හා වැටුප් වර්ධකයකට සමාන මාසික විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු.1500/= ප්‍රසාද මුදලක් ද ගෙවිය හැකිවේ.

3 : 2 : 3 ඉහත 3 : 2 : 1 දක්වා ඇති විභාගයකින් සම්මාන/අධි සම්මාන(බී හා සී සාමාර්ථ)/සාමාර්ථ සහිතව අදාල භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කරන නිලධාරියෙකුට එක් භාෂාවක් සඳහා රු.150/= බැගින් දෙවන හා තෙවන භාෂා සඳහා රු.300/=ක උපරිම දීමනාවක් හා වැටුප් වර්ධකයකට සමාන මාසික විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් ද එක් වරක් පමණක් ගෙවන රු.2000/=ක ප්‍රසාද මුදලක් ද ගෙවිය හැකිවේ.

3 : 2 : 4 ඉහත 3 : 2 : 1 දක්වා ඇති විභාගයකින් විශිෂ්ඨ සම්මාන සාමාර්ථය සහිතව (A සාමාර්ථ) අදාල භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කරන නිලධාරියෙකුට එක් භාෂාවක් සඳහා රු.150/= බැගින් දෙවන හා තෙවන භාෂා සඳහා රු.300/=ක උපරිම දීමනාවක් ද වැටුප් වර්ධකයකට සමාන මාසික විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් ද හා එක් වරක් පමණක් ගෙවන රු.2500/= ක ප්‍රසාද මුදලක් ද ගෙවිය හැකිවේ.

3 : 2 : 5 දිරිදීමනා ඉල්ලා සිටිනු ලබන දෙවන හා තෙවන භාෂාව සාමාන්‍ය උපාධි හෝ ඊට ඉහළ විභාගයකින් විෂයක් ලෙස හදාරා සමත්ව හෝ අදාල භාෂා මාධ්‍යයෙන් සාමාන්‍ය හෝ විශේෂ උපාධි/පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට එක් භාෂාවකට රු.150/= බැගින් භාෂා දෙකටම රු.300/=ක උපරිම දීමනාවක් ද, වැටුප් වර්ධකයකට සමාන මාසික විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් ද හා එක් වරක් පමණක් ගෙවනු ලබන රු.5000/= ප්‍රසාද මුදලක් ද ගෙවිය හැකිවේ.

3 : 2 : 6 ඉහත 3 : 2 : 5 යටතේ පශ්චාත් උපාධි ගණයට හෝ ඩිප්ලෝමා ගණයට නොවැටෙන ඊ හා සමාන ලෙස සැලකෙන වෙනත් කුමන හෝ ඩිප්ලෝමා සහතිකයන් මෙම චක්‍රලේඛයේ 3 : 2 : 4 වගන්තියෙන් ආවරණය වන ලෙස සැලකිය යුතුය.

3 : 2 : 7 "මුල් අවස්ථාවේ සාමාන්‍ය සාමාර්ථය ලබා දිරිදීමනාව ලබන නිලධාරියෙකුට පසුව සම්මාන සාමාර්ථ/විශිෂ්ඨ සම්මාන සාමාර්ථ හෝ උපාධි මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කළහොත් ඊට අනුරූපව ගෙවනු ලබන ප්‍රසාද මුදල ලබාගැනීමට හිමිකම ඇතිවන්නේය. එසේ වුවද මීට පෙර ගෙවන ලද ප්‍රසාද මුදල හා ලැබිය යුතු ප්‍රසාද මුදල අතර වෙනස පමණක් එබඳු අවස්ථාවල ගෙවිය යුතුවේ."

04. අනෙකුත් කොන්දේසිඃ-

04.1 බඳවා ගැනීමේ පරිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාව අනුව හෝ කිසියම් නිලධාරියෙකු සේවයට ඇතුලත් වීමේදී හෝ සේවයට ඇතුලත් වීමෙන් පසුව හෝ කිසියම් භාෂාවක ප්‍රවීණතාව ලබාගත යුතු යැයි නියම කර ඇති විටක (උදා:මාණ්ඩලික නිලධාරීන් භාෂා පරිවර්තකයින්) එම නියමයන් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රවීණතා සහතිකය මෙම චක්‍රලේඛයේ සඳහන් දිරිදීමනාව ලබාගැනීම සඳහා අදාල වන්නේ නැත.

<u>සටහන:</u> එසේ වුවද,

(අ) භාෂා පරිවර්තක සේවයේ නිලධාරීන්ට තමා සේවය කිරීමට බැඳී ඇති භාෂා දෙක හැර වෙනත් අනුමත භාෂාවකින් ප්‍රවීණතාවය දක්වන්නේ නම් ඒ සඳහා ද

(ආ) රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් හෝ දෙවැනි භාෂා අවශ්‍යතාවයෙන් හෝ නිදහස්වීම සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය, ඉල්ලා සිටිනු ලබන භාෂා ප්‍රවීණතා මට්ටමේ විභාගයකට වඩා ඉහළ මට්ටමකින් යුක්ත වන විභාගයකින් සුදුසුකම් ලබන අවස්ථාවක එම ඉහළ මට්ටම සඳහා ද මෙම දිරිදීමනාව ගෙවිය හැකිය.

උදාහරණ: ප්‍රවීණතාවය සනාථ කිරීම සඳහා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයට සාමාන්‍ය සාමාර්ථයක් අවශ්‍ය වූ අවස්ථාවකදී යම් නිලධාරියකු අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වී ඇති බවට සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම්, රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් හෝ දෙවන භාෂා අවශ්‍යතාවයෙන් නිදහස් වන අතරම අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වීම නිසා හිමිකම් ලබන දිරිදීමනා ලැබීමට එය එම නිලධාරියාට බාධාවක් නොවේ. එහෙත් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයට සාමාන්‍ය සාමාර්ථයක් අවශ්‍ය අවස්ථාවකදී ඔහු ඉදිරිපත් කරන අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකය සම්මාන සාමාර්ථයකින් හෝ විශිෂ්ඨ සම්මාන සාමාර්ථයකින් යුක්ත වුවද එම සහතිකය අනුව සම්මාන සාමාර්ථයක් හෝ විශිෂ්ඨ සම්මාන සාමාර්ථයක් සඳහා පමණක් දීමනා ලබාගැනීමට ඔහු සුදුසුකම් නොලබයි.

04.2 බඳවා ගැනීමේ පරිපාටිය අනුව හෝ බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමේ අමතර භාෂාවක කිසියම් මට්ටමක ප්‍රවීණතාව විශේෂ සුදුසුකමක් ලෙස සලකන අවස්ථාවන්හිදී එබඳු සේවාවල නිලධාරීන්ගේ ඉහත සඳහන් කළ මට්ටම සඳහා වන අදාළ භාෂා ප්‍රවීණතාවය මෙම චක්‍රලේඛයේ දිරිගැන්වීමේ දීමනාව සඳහා සලකා බලනු නොලැබේ. එහෙත් එකී මට්ටමට ඉහළ අදාළ භාෂා ප්‍රවීණතාවය සඳහා දිරිදීමනා ලබාගැනීමට බාධාවක් නැත."

04.3 මෙම දීමනාව ගෙවිය හැකි වන්නේ සේවයේ ස්ථිරත්වය ලබා ඇති නිලධාරීන්ට පමණි.

04.4 1957.05.23 දිනැති අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය යටතේ රු.500/= ක දීමනාවක් ලබා ඇති නිලධාරියෙකු ද නියමිත සුදුසුකම් සපුරා ඇත්නම් සිංහල භාෂාවට දිරිදීමනා ලැබීමට සුදුසුකම් ලබන අතර උක්ත චක්‍රලේඛයෙන් ලබාදී ඇති රු.500/= ප්‍රසාද දීමනාව මෙම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව හිමි ප්‍රසාද දීමනාවෙන් එකවර අඩු කළ යුතුය.

04.5 1988.02.11 දිනැති අංක 5/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ගෙවන ලද රු.500/= දීමනාව මෙම චක්‍රලේඛය යටතේ ගෙවනු ලබන දීමනාවෙන් එකවර අඩු කළ යුතුය.

04.6 භාෂා ප්‍රවීණතාවය සඳහා දිරිගැන්වීමේ ක්‍රම හඳුන්වා දෙන ලද 1989.07.31 දිනැති අංක 38/89, 1990.03.12 දිනැති අංක 38/89(I), 1991.04.24 දිනැති අංක 38/89(II), 1995.10.09 දිනැති අංක 38/89(III) හා 1998.04.24 දිනැති අංක 9/98 චක්‍රලේඛ යටතේ නිලධාරීන්ට එක් වරක් පමණක් ගෙවන ලද ප්‍රසාද මුදල් දීමනාව මෙම චක්‍රලේඛය යටතේ ගෙවනු ලබන ප්‍රසාද දීමනාවෙන් එකවර අඩු කළ යුතුය.

04.7 යම් සීමිත කුසලතා පරීක්ෂණ මගින් සේවාවකට ඇතුලත් වන නිලධාරීන්ට නියමිත භාෂා ප්‍රවීණතාවය වන්නේ විවෘත තරඟ විභාගයකින් සේවාවට ඇතුලත් වන නිලධාරීන්ට අදාළ ප්‍රවීණතා මට්ටම වේ.

04.8 දිරි දීමනා ලබාගන්නා නිලධාරීන්, රජයට අවශ්‍ය වන විට තමන් ප්‍රවීණතාව දක්වන දෙවන හෝ තෙවන භාෂාව හෝ ඒ දෙකෙන්ම සිය අමතර දීමනාවකින් තොරව රජයට සැපයීමට බැඳී සිටී. එසේ අපොහොසත් නිලධාරීන්ගේ දිරි දීමනා නතර කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

05. වෙනත් කරුණු:

05.1 මෙම ක්‍රමය යටතේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව පෞද්ගලික ලිපිගොනු, ලෙජර හා වැටුප් පත්‍රිකාවන් වැනි රාජකාරි ලේඛණවල වෙන වෙනම පෙන්නුම් කළ යුතුය.

05.2 මෙම චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇත්නම් එය ආපසු අයකර ගැනීමට කටයුතු කළයුතුය.

05.3 මේ චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී යම් ගැටළුවක් මතු වන්නේ නම් ඒ පිළිබඳව ආයතන අධ්‍යක්ෂ වෙත කරුණු ඉදිරිපත් කර තීරණයක් ලබා ගත යුතුය.

( පී.ඒ.සේනාරත්න )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

නි/5/Basa.